# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය - ප්‍රථම වසර - 2018

## රෝම නීතිය

පැ තුනයි (03)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව - 07

ප්‍රශ්න <u>පහකට (05)</u> පමණක් පිළිතුරු සපයන්න.
(අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කෙරේ.)

---

01. "නව නීති උත්පාදනයට වඩා පැවති නීතිය සංග්‍රහිත කිරීම ජස්ටිනියන් විසින් නීති ක්ෂේත්‍රය තුළ අත්පත් කරගත් ප්‍රධාන තම ජයග්‍රහණයයි."

ඔබ එකඟවන්නේද?

ජස්ටිනියන්ගේ නීති සංග්‍රහිත කිරීමේ ක්‍රියාවලිය ඇසුරෙන් ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

02. නිදහස් විවාහයකට ලුක්‍රීෂියා සහ ඇල්බස් එළැඹ සිටි අතර ඇන්ටෝනියස් නැමැති ඔවුන්ගේ පුත්‍රයා දස හැවිරිදි වන විට ඇල්බස් උණ රෝගයකින් මිය ගියේය. ඉන් වසර දෙකක් ඇවෑමෙන් ලුක්‍රීෂියා ස්වීය නෛතික තැනැත්තෙක් වූ බැල්බස් සමග මානුස් විවාහයකට එළැඹී අතර ඔවුනට බෲටස් සහ ක්ලෝඩියා නමින් පුත්‍රයෙක් සහ දියණියක් වූහ. බැල්බස් හා ලුක්‍රීෂියා එක් වී සාර්ථක බේකරි ව්‍යාපාරයක් සහ වයින් අලෙවි සැලක් පවත්වාගෙන ගිය අතර බැල්බස්ට අයත් අලෙවි සැල් කිහිපයක්ම අන් අයට කුලියට ලබා දී තිබුනි. ඇන්ටෝනියස් ද ඔවුන් සමග ජීවත් වූ අතර බෲටස් සහ ක්ලෝඩියා පිළිවෙළින් දාහත් හැවිරිදි සහ දහසය හැවිරිදි වන විට බැල්බස් මිය ගියේය. ඔහුගේ අභාවයෙන් තෙමසක් ඇතුළත ලුක්‍රීෂියාගේ පාර්ශවයේ ආදි පුරුෂ පරම්පරාවේ ඥාතීන් සියල්ලෝම මියගොස් ඇති බව ඇය දැන ගත් අතර ලුක්‍රීෂියා ඇයගේ දරුවන් සමග ආපනශාලාවක් පවත්වාගෙන යාමට තීරණය කළාය. ක්ලෝඩියා ද නිදහස් විවාහයකට එළැඹීමට සැලසුම් කර ඇත.

අ.පි.බ.

ලුක්‍රීෂියා සහ ඇයගේ දරුවන්ට රෝම පවුල නමැති (*familia*) ක්ෂේත්‍රය තුළ හිමිවන තත්ත්වය (**status**) සහ ඔවුනට දේපළ දැරීමට ඇති හැකියාව පිළිබඳව අදහස් දක්වන්න.

ඔබගේ පිළිතුර නෛතික සිද්ධාන්ත ඇසුරෙන් සනාථ කළ යුතු වේ.

03. ධනවත් වෙළෙන්දෙක් වූ ට්‍රාජන් සුප්‍රසිද්ධ චිත්‍ර ශිල්පියෙක් සහ කිවියෙක් ද විය. තම මිතුරා වන පොලොක්ස්ගේ වතුයායේ නිවාඩුවක් ගත කරමින් සිටියදී පොලොක්ස්ට අයත් අගනා පාර්චිමන්ට් කඩදාසියක පද්‍ය රචනාවක් ලියූ අතර පුවරුවක් මත චිත්‍රයක් පින්තාරු කළේය. ඔහු පෙරළා රෝමයට පැමිණෙන විට පොලොක්ස්ට අයත් එම අගනා පාර්චිමන්ට් කඩදාසිය සහ පුවරුව ද කැටුව ආවේය. ට්‍රාජන්ගේ පුත්‍රයා වන ජූලියස් විසින් ෆීලික්ස් සහ ලූෂියස්ට අයත් වයින් සහ තිරිඟු තොග ට්‍රාජන්ගේ බඩු ගබඩාවේ ගබඩා කිරීම සඳහා භාරගත්තේය. ජූලියස් ඒවා වෙන වෙනම ගබඩා නොකළ අතර 'වයින් නම් සියල්ලම වයින්' 'තිරිඟු නම් සියල්ලම තිරිඟු' යයි පවසමින් වයින් තොග දෙකම එක් විශාල ගුදමකට දැමූ අතර තිරිඟු තොග දෙකම මිශ්‍ර කොට එක් විශාල තිරිඟු ගොඩක් සෑදුවේය. අක්කර තුනක භූමි භාගයක පිහිටා තිබූ ට්‍රාජන්ට අයත් ඇපල් යායේ ඵලප්‍රයෝජනලාභියා වූ (*usufructuarius*) මාකස් විසින් ඇපල් ඵලදාව එක්රැස් කරගැනීමට පෙර මියගිය අතර පිටස්තරයකු වූ රේමස් ඇපල් වත්තට ඇතුල් වී එහි අක්කරයක් පුරා පිහිටි ඇපල් වගාවේ ඵලදාව රැස් කර ගත්තේය. ඇපල් නෙලාගැනීමට සහ රේමස් විසින් අත්පත් කරගත් ඇපල් වෙනුවෙන් සාධාරණය ඉටු කිරීම සඳහා, එළැඹෙන සතියේ එහි පැමිණෙන බව මාකස්ගේ උරුමකරුවන සැබිනස් විසින් ට්‍රාජන්ට දැනුම් දෙන ලදී. තමාට අයත් අගනා පාර්චිමන්ට් කඩදාසිය සහ පුවරුව ආපසු ලබාදෙනමෙන් පොලොක්ස් ලිපියක් මගින් ට්‍රාජන්ගෙන් ඉල්ලා සිටියේය.

උක්ත සිද්ධිමය අවස්ථාවට අදාළ වන නීතිමය මූලධර්ම සහ හේතු සඳහන් කරමින් ට්‍රාජන්ට උපදෙස් දෙන්න.

04. (අ) 'කුලියට දීම, විකිණීම සහ මිලදී ගැනීමට සමානරූපී වන අතර එකම නීතිමය රීතීන් යටතේ ස්ථාපනය කළ හැකි විය.'

නිදර්ශන සහිතව උක්ත ප්‍රකාශයේ වලංගුතාව විමසන්න.

අ.පි.බ.

(ආ) සිංහයන් හීලෑ කිරීම සඳහා පුහුණුකරුවන් ලෙස යෙදවීමට x සතු වහලුන් දස දෙනෙක් එක් මසක කාලයකට Y ට භාර දුන් අතර Y විනෝදාස්වාදය සඳහා සංදර්ශන පැවැත්වූ සර්කස් කණ්ඩායමක හිමිකරු ද විය. අදාළ කාලසීමාව අවසානයේදී තුවාළ රහිතව ආපසු භාරදෙන වහලුන් වෙනුවෙන් සොලිඩි 150 ක් ගෙවීමටත්, සිංහයන් හීලෑ කිරීමේදී තුවාළ ලබන සහ මියයන එක් වහලෙක් වෙනුවෙන් සොලිඩි 1500 ක් ගෙවීමටත් Y එකඟ විය. එසේ ලබාගත් වහලුන් අතුරෙන් පස් දෙනෙක් කිසියම් අනතුරුදායක කැණීම්වල යෙදවීමට Y කටයුතු කළ අතර එබඳු වැඩවල නිරත වීමට ඔවුන් හට කිසිදු විශේෂ නිපුණතාවක් හෝ පුහුණුවක් නොතිබූ බව Y දැන සිටියේය. කැණීම් කටයුතුවල නිරතව සිටියදී එම වහලුන් පස් දෙනාට තුවාල සිදු වූ අතර සිංහයන් හීලෑ කිරීමේ කටයුතුවල නිරතව සිටි අනෙක් වහලුන් අතුරෙන් තිදෙනෙක් මිය ගිය අතර ඉතිරි වහලුන් දෙදෙනා නිරුපද්‍රිතව නියමිත දිනයේදී X ට ආපසු භාර දුන්නේය.

උක්ත සිද්ධිදාමය ඇසුරෙන් හට ගන්නා නෛතික ආනුෂාංග හඳුනාගනිමින් පාර්ශවීය අයිතිවාසිකම් සහ වගකීම් පිළිබඳව ඔවුනට උපදෙස් දෙන්න.

**05.** කැපිටෝ හට රෝම සෙනෙට් සභිකයෙක් වන සෙම්ප්‍රෝනියස් සහ ඔහුගේ බිරිඳ කැල්පර්නියා නාට්‍යශාලාවේ ප්‍රවේශය අසලදී හමුවන අතර කැල්පර්නියා පහත් චරිතයක් සහිත තැනැත්තියක් බව ප්‍රකාශ කළේය. කැපිටෝගේ මුහුණට පහරක් එල්ල කරමින් "වැදගම්මකට නැති කැපිටෝගේ පියාට නින්දා කරන්නේ මෙසේ" යයි සෙම්ප්‍රෝනියස් උස් හඬින් කෑ ගැසුවේය. දබරවන අවස්ථාවේදී කැපිටෝගේ වම් ඇසට බරපතල තුවාල සිදු වූ අතර ඔහුට ප්‍රතිකාර කළ වෛද්‍යවරයා විසින් වැරදි ඖෂධයක් එන්නත් කිරීම නිසා ඔහුට එම ඇසේ පෙනීම අහිමි විය. රෝමයේ පවත්වන සංගීත සංදර්ශනවලදී ඉමහත් ඉල්ලීමක් තිබූ 'ත්‍රී බ්‍රදර්ස්' නැමැති පොප් ගායක කණ්ඩායමේ කැපිටෝ ප්‍රධාන ගායකයා විය.

(අ) අදාළ අයිතිවාසිකම් හා වගකීම් ඇසුරෙන් පාර්ශවයන්ට උපදෙස් දෙන්න.

(ආ) උක්ත සිද්ධිමය අවස්ථාවට 'උග්‍ර පීඩාව' (*atrox injuria*) නැමැති සිද්ධාන්තයේ කිසියම් අදාළත්වයක් තිබේදැයි පැහැදිලි කරන්න.

**06.** සේයස් සහ අවුලුස් නැමැති පුතුන් දෙදෙනෙක් මාකස්ගේ පිතෘ බලය යටතේ පසු වූ අතර සීනෝ නැමැති පුත්‍රයා බලයෙන් මුදාහැර ඇත. මරණ මංචකයේ සිටියදී මාකස් සිය අන්තිම කැමති පත්‍රය සැකසූ අතර එහි මෙසේ සඳහන් කර ඇත. "මාගේ මරණයෙන් වසරක් ඇතුළත ට්‍රිබෝනියස් ගේ දියණිය වන පෝෂියා විවාහ කර

අ.පි.බ.

ගන්නේ නම් සේයස් මාගේ උරුමකරු වේවා! එම කාල සීමාව තුළ දී පෝෂියා සමඟ සේයස් විවාහ නොවුනේ නම් අවුලුස් මාගේ උරුමකරු වේවා!". මාකස්ගේ අභාවයෙන් දෙමසක් ඇතුළත පෝෂියා සමග සේයස් විවාහ විය.

(අ) මාකස්ගේ අන්තිම කැමති පත්‍රයේ වලංගුභාවය සාකච්ඡා කරන්න.

පෝෂියා සමඟ සේයස් විවාහ නොවුනේ නම් ඔබගේ පිළිතුර වෙනස් වේද?

ඔබගේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) (i) යුතුකම් පැහැර හරින ලද අන්තිම කැමති පත්‍රයකට එරෙහි පැමිණිල්ල (*querella inofficiosi testamenti*) ඉදිරිපත් කළ හැකි වූයේ කවර අවස්ථාවලදීදැයි පැහැදිලි කරන්න.

(ii) එකී පැමිණිල්ලෙන් උද්ගත වූ නෛතික ප්‍රතිවිපාක කවරේදැයි සඳහන් කරන්න.

07. (අ) 'නීතිමය අයිතිවාසිකම් හෝ යුතුකම් කිසිවක් වහලෙක්ට නොතිබුනි.'

ඔබ එකඟවන්නේද? නෛතික සිද්ධාන්ත ඇසුරෙන් ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) කැස්කා සති දෙකක නිවාඩුවක් ගත කිරීම සඳහා බැහැරව ගිය වහාම ඔහුගේ වහලා වූ පෙටෲස් අඛණ්ඩව පැය 5 ක් වයින් පානය කළ අතර අනතුරුව කැස්කාගේ හොඳම ඇඳුම්වලින් සැරසී කැස්කාගේ නිවසේ සඳළුතලයේ සිට දේශපාලඥයන් පිළිබඳව අශෝභන ගීත ගායනය කරමින් පහළින් ගමන් කරමින් ගත් අය වෙත අපිරිසිදු ජලය විසි කළේය. කැස්කාගේ අසල්වැසියා වූ පවුලුස් එම අශෝභන ගායනයට විරෝධය පෑ බැවින් අපිරිසිදු ජල බාල්දි දෙකක් පෙටෲස් විසින් පවුලුස් ගේ ඇඟට වත් කරන ලදි. පවුලුස් ගේ හොඳම කබායේ කදබල පැල්ලම් හටගත් අතර එහි තිබූ සායම් දිය වී ගියේය. සන්ධ්‍යා භාගයේ දී දිග පිහාටුවක් ඇකැතිව වීදි සංචාරය කළ පෙටෲස් එහි ගමන් ගත් අයට නොමනා ලෙස කවටකම් කළ අතර එයින් මිදීමට මාර්ගයෙන් ඉවතට පැනීම නිසා ෆෙස්ටස් ලිස්සා ගොස් මාර්ගයේ ඇද වැටීමෙන් ඔහුගේ පාදයක් බිඳී ගියේය. රෝහල කරා යන අතරතුරදී ෆෙස්ටස් පැළඳ සිටි කෘතිම දත් අස්ථාන ගත වී තිබුනි.

උක්ත සිද්ධිදාමයේදී කැස්කාගේ සහ පෙටෲස්ගේ වගකීම උචිත නෛතික සිද්ධාන්ත ඇසුරෙන් සාකච්ඡා කරන්න.

ᴏ∘ᴏ∘ᴏ∘ᴏ∘ᴏ∘ᴏ∘ᴏ∘